3 වන පිටෙන්

මුල්‍ය ආයතනවල ආයෝජනය කිරීම නිසා පොලියත් මුදලත් අහිමිවී බොහෝ දෙනා අසරණ වූහ. එනිසාම බහුතරයක් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ බලාපොරොත්තු ඇතිකර ගත්තත් පනත එළිදැක්වීමෙන් පසු එහි ඇති අවාසි නිසාම ජනතා අප්‍රසාදය පළවිය.

මේ පෞද්ගලික විශ්‍රාම වැටුප සඳහා අරමුදල් සපයා ගන්නා අයුරු

1 සේවකයාගේ මාසික වැටුපෙන් 2%
2 සේව්‍යයා සේවකයාට ලබාදෙන මාසික වැටුපෙන් 2%
3 සේවක අර්ථසාධක අරමුදලේ අවසන් ශේෂයෙන් 2%
4 විශ්‍රාම පාරිතෝෂික අරමුදලින් (ග්‍රැටිවිටි) 10%
5 සේවක භාරකාර අරමුදලේ ලාභයෙන් 10% වශයෙනි.

මෙසේ ලබාගන්නා මුදල් විශ්‍රාම වැටුප් අරමුදලට බැර වන අතර ඔහුට විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙන්නේ වසර 10 ක සේවා කාලයකින් පසුවය. එනම් වයස 40 දී මෙයට දායක වන අයකුට විශ්‍රාම ලැබෙන්නේ වසර 55 දීය. නමුත් විශ්‍රාම වැටුප ගෙවන්නේ වසර 60 දී එනම් විශ්‍රාම වැටුපට දායක වී වසර 20 කට පසුය. ඔහු සේවයෙන් විශ්‍රාම ලබා වසර 5 ක කාලයක් කිසිදු දීමනාවක් නොලබා බලාසිටිය යුතුය. මුලින්ම මෙහි ප්‍රතිලාභ ලැබීම සඳහා යෝජනා කර සිටියේ වයස 18 ට අඩු දරුවන්ය. ඔවුන්ට ගිණුමේ ශේෂයෙන් 60 % ක් ගෙවන අතර ඉතිරි 40% ට හිමිකම් ලබන්නකු නැත. කලත්‍රයාට (ස්වාමියාට හෝ බිරිඳට) විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමේ අයිතියද නොවීය. නමුත් විරෝධතා නිසාම එය සංශෝධනය විය. එසේම වසර 9 ක් දායක මුදල් ගෙවූ අයකු මියගිය හොත් හෝ සේවයෙන් ඉවත්ව ගියහොත් ඔහුට ලැබෙන ප්‍රතිලාභයක්ද නැත. මුල්ම සේවක අර්ථසාධක හිමියන්ට මෙය වලංගු නොවන බව පැවසුවත් අර්ථසාධක අරමුදලින් මුදල් කපා ගැනීමට යෝජනා කරයි.

මුලදී මේ අඩුපාඩු කිසිවක් පාලන පක්ෂයේ කිසිවකුට නොපෙනීම පුදුම සහගතය. ඇතැම් විට ඔවුන් එම අඩුපාඩු දැක්කත් තම වරප්‍රසාද ගිලිහී යන නිසා මුණිවත රකින්නට ඇත. එනිසාම මෙම විශ්‍රාම වැටුප් පනතට විරුද්ධවන අය යූඑන්පී කාරයෝ, නැතිනම් ජේවීපී කාරයෝ හෝ හාම්පුතුන්ගේ මුදලට කෑගහන අයය. නැතිනම් සෑම හොඳ දෙයකටම විරුද්ධවන ජනතා ද්‍රෝහීන් ලෙස පාලක පක්ෂය හඳුන්වන අයය.

පෞද්ගලික අංශයේ කාන්තාවන් වයස අවු. 50 දී විශ්‍රාම ගන්වන අතර පිරිමින් වයස අවු. 55 දී විශ්‍රාම ගන්වයි. මේ ගැන කම්කරු ඇමැතිවරයා පවසන්නේ හාම්පුතුන් සමග කතාකර ඔවුන්ගේ විශ්‍රාම යැමේ වයස් සීමාව 60 දක්වා දීර්ඝ කිරීමට ඉල්ලීමක් කරන බවයි. ඔවුන් එම ඉල්ලීම පිළිගනීවිද? එසේම දීර්ඝකාලීනව සාමාජික මුදල ගෙවා කල්පිරීමට පෙර ඉවත්ව යන අයට යම් කොටසක් ගෙවීමට සංශෝධන ඉදිරිපත් කරන බව පවසයි. ජනතා හිතෛෂී වගකිවයුතු රජයක් පනතක් ඉදිරිපත් කිරීමේදී එහි විශ්වාසනීයභාවයක් තිබිය යුතුය. අද අඩුපාඩු පෙන්වා දෙන තරමට එය සංශෝධනය කරන්න බලනවා යෑයි කීම යුක්ති යුක්තද?

පෞද්ගලික අංශයේ සේවකයන්ගෙන් අද අන්ත අසරණභාවයට පත්වී ඇති පිරිසක් සිටිති. ඔවුන් නම් විවිධ නිෂ්පාදන ආයතනවල කුලී පදනම මත වැඩකරන සේවකයන්ය. මිනිස් බලශක්ති ආයතන මගින් බඳවාගන්නා ඔවුන්ට ස්ථාවර වැටුපක් නොමැත. සේවක අර්ථසාධක, සේවක භාරකාර අරමුදල්, සේවා පාරිතෝෂික මුදල් කිසිවක් හිමිනොවේ. එසේනම් ඔවුන් මෙම විශ්‍රාම වැටුපට දායක වන්නේ කෙසේද? එසේම ස්වයං රැකියාලාභීන්ට එදිනෙදා කුලී වැඩ කරන අයට අත්වන ඉරණම කුමක්ද? අනාගතයේදී කිසිවකුගේ පිළිසරණ නැතුව අසරණ වෙන්නේ මෙම පිරිස් නොවේද?

අනාගතයේ රජයට බරක් යෑයි සිතන පෞද්ගලික අංශයේ සේවකයා සේවක අර්ථසාධක අරමුදල මගින් දළ ජාතික ආදායමින් 16% ක් සපයයි. එය 2009 සංඛ්‍යා ලේඛනවලට අනුව රු. බිලියන 769.3 කි. එම මුදල් සේවකයා විශ්‍රාම යනතෙක් පරිහරණය කරන්නේ රජයයි. එනිසා මීට වඩා රජය පෞද්ගලික අංශයේ සේවකයන් ගැන නම්‍යශීලීව බැලිය යුතුය. රාජ්‍ය අංශයේ පහළම ශ්‍රේණියේ සේවකයාගේ වැටුප රු. 11900 පමණ වන අතර ඔහු ජීවන වියදම් දීමනා හා අනෙකුත් දීමනා සමග රු. 17,000 පමණ වැටුපක් ලබාගනී. නමුත් පෞද්ගලික අංශයේ සේවකයාගේ අවම වැටුප රු. 7000 ටත් අඩුය. කිසිදු අයවැයක් මගින් මෙම වැටුප වැඩිකිරීමට තීරණය කළාද? එසේ තිබියදී ඔවුනගේ වැටුපෙන් සේවකයාගේ අවසරයක් නොමැතිව මුදල් කපා ගැනීම සාධාරණද? වැටුපෙන් පමණක් නොව ඔහු විශ්‍රාම යනවිට ආයතනයෙන් දෙන පාරිතෝෂික දීමනාවෙන්ද 10% ක් කපා ගැනීමට යෝජනා කරයි. එසේ මුදල් කපා ගන්නවානම් ඒ සෑම මුදලක්ම එම මුදල් ගෙවූ දායකයාට හෝ ඔහුගේ යැපෙන්නන්ට උරුම විය යුතුය. නොඑසේනම් බුදුදහමට අනුව එය අදත්තා දානයකි. නුදුන් දෙයක් ගැනීමකි. පෞද්ගලික අංශයේ සේවකයාට ගෙවීමට යෝජිත විශ්‍රාම වැටුප පිංපඩියක් නොව ඔහුගෙන්ම කපාගන්නා මුදලින් ගෙවන්නකි. ඒ මුදල රජය වසර 5 ක් රඳවාගෙන සිටියත් එයට ගෙවන්නේ 2.5 % ක් වැනි සොච්චම් පොලියකි. කිසිවිටකත් පෞද්ගලික අංශයේ සේවකයන් තමන් බලයට පත්කළ ජනතාවාදී රජයකින් මෙවැන්නක් බලාපොරොත්තු නොවේ. මේ ඉදිරිපත් කළ පනත විද්වතුන්ට නොපෙන්වා නූගත් කම්කරුවකුට පෙන්නුවානම් ඔහු මෙහි අඩුපාඩු පෙන්වා දෙනු ඇත.

අද කම්කරු ඇමැතිවරයාට සිදුවී ඇත්තේ මෙහි අඩුපාඩු පෙන්වා දෙනවිට ඒක අපි සාකච්ඡා කර සංශෝධනය කරනවා යැයි කීමට පමණි.

මෙම විශ්‍රාම වැටුපටකපාගන්නා මුදල පිළිබඳව ස්ථිර සහතිකයක් තිබේද? විටින් විට අරමුදල පාඩු ලබන බව පවසා සේවකයාගෙන් කපාගන්නා මුදල් වැඩිකළහොත් ඔහුට සිදුවන්නේ කුමක්ද? අද කම්කරු ඇමැතිවරයාට සිදුවී ඇත්තේ මෙහි අඩුපාඩු පෙන්වා දෙනවිට ඒක අපි සාකච්ඡා කර සංශෝධනය කරනවා යෑයි කීමට පමණි. එම නිසා හොඳ දෙයක් කරනවානම් වරක් නොව දසවරක්වත් එය අධ්‍යයනයකර ඉදිරිපත් කිරීම රජයක යුතුකම නොවන්නේද?

කම්කරු ඇමැතිතුමනි, දැනට රු. 25,000 වැටුපක් ලබන පෞද්ගලික අංශයේ සේවකයකු වසර 30 ක සේවාකාලයකින් පසු විශ්‍රාම ලැබුවහොත් ඔහුට, සේවක අර්ථසාධක, සේවා බාරකාර, සේවා පාරිතෝෂික අරමුදල් සමග රු. ලක්ෂ 30 ක් පමණ ලැබේ. ඉන් ලක්ෂ 5 ක් රාජ්‍ය බැංකුවක වසර 5 ස්ථාවර තැන්පතුවක් දමන ලෙස පවසා අර්ථසාධක අරමුදල් හිමියන්ට විශේෂ පොලී අනුපාතයක් ලෙස 10% ගෙවීමට තීරණය කළ හොත් ඔහු වසර 5 කින් පසු රු. 6000 කට වැඩි මාසික දීමනාවකට හිමිකම් කියන අතර ඔහුගේ මුදලද බැංකුවේ ඉතිරි වේ.

මෙම තැන්පත් මුදල ලක්ෂ 10 ක් වුවහොත් වසර 5 ක ස්ථාවර තැන්පතු කාලයකින් පසු ඔහුට (1.61,510 පොලී මුදලක් ලැබේ. 161.510 ද 12 * 13420) ඔහුට මාසිකව රු. 13000 කට වඩා වැඩි මාසික පොලියක් උපයාගත හැකිය. ඔහු මුළු විශ්‍රාම දීමනාව වන ලක්ෂ 30 බැංකුවක ස්ථාවර තැන්පතුවක් ලෙස ආයෝජනය කළහොත් 10 % පොලී අනුපාතය මත ඔහුට ලක්ෂ 3 ක පොලී මුදලක් ලැබෙන අතර මාසිකව රු. 25.000 ක පොලී ආදායමක් උපයාගත හැකි අතර ඉන් රාජ්‍ය බැංකු පද්ධතියද ශක්තිමත් වේ. එසේම තැන්පත් මුළු මුදලම අනාගත ආයෝජනයන් සඳහා ඉතිරිවේ. එසේනම් මේ විශ්‍රාම වැටුප ලබාදිය යුත්තේ ස්ථිර රැකියාවක් නොමැති ස්වයං රැකියා කරන පිරිස් වලට හා අවිධිමත් රැකියාවන් කරන පිරිසටය. එසේ නොමැතිව විශ්‍රාම වැටුපක මුවාවෙන් ඔවුන්ගෙන් කපාගන්නා මුළු මුදල ආපසු නොගෙවන විශ්‍රාම වැටුපකට කැමැති වන්නේ කවුද? එසේ වුවහොත් එය ජනතාව ගැන හිතන රජයක් වැඩකරන ජනතාවට කරන නිගාවකි.

මීට පෙර ද ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් අංක 17 දරන සමාජ ආරක්ෂණ පනතින් හා 1999 අංක 33 දරන සමාජ ආරක්ෂණ පනතින් ස්වයං රැකියාවල හා විවිධ අවිධිමත් අංශයේ සේවයේ නියුතුවන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදුනි. ඒ ක්‍රමයන්ද ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවුනේ ඒවා හි ඇති අඩුපාඩු නිසා නොවේද? යෝජිත විශ්‍රාම වැටුප් ක්‍රමය අපේ මුදලින් අපට ලබා දෙන්නක් නම් එයට බලහත්කාරයෙන් බඳවා නොගෙන සේවකයන්ගේ කැමැත්ත මත බැඳීමට අවස්ථාව ලබා දුනහොත් එය කොතරම් ප්‍රජාතන්ත්‍රවාදී දැයි සිතා බලනු වටී.

බණ්ඩාර කපිලරත්න

කපා වෙන්කර තබාගන්න

Australian Government
Office of the Migration Agents Registration Authority

MARA කාර්යාලය (Office of the MARA) යනු කුමක්ද?

MARA කාර්යාලය යනු ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් වශයෙන් සුදුසු සහ නිසි පුද්ගලයන් පමණක් අනුමත කරන සහ ඔවුන්ට එරෙහි පැමිණිලි විමර්ශණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන පාලන ආයතනයයි. මෙය සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුවට (Department of Immigration and Citizenship) අනුයුක්ත කාර්යාලයකි.

සංක්‍රමණ නියෝජිතයෙකු තෝරා ගැනීම

- සියළුම සංක්‍රමණ නියෝජිතයන් හට ඔවුන් හට ආවේණික සංක්‍රමණ නියෝජිත ලියාපදිංචි අංකයක් (MigrationAgents Registration Number (MARN)) ඇත.
- MARA කාර්යාලයේ වෙබ් අඩවිය වෙත ගොස් MARN අංකය පරීක්ෂා කර බැලීම මගින් යම් අයෙකු ලියාපදිංචිවී ඇතිද යන්න සොයා බැලිය හැකිය.
- නීතිඥවරුන් සහ අධ්‍යාපන නියෝජිතයන් විසින් ඕස්ට්‍රේලියාව තුල සංක්‍රමණ උපදෙස් ලබාදීමට පෙර ලියාපදිංචිවී සිටිය යුතුය.
- ***යම් අයෙකු සංක්‍රමණ නියෝජිතයෙකු වුවද, කිසිම අයෙකු හට ඔබ වෙත වීසා බලපත්‍රයක් ලැබෙන බවට සහතිකයක් ලබා දිය නොහැකිය.***
- බැහැර කර ඇති අවස්ථාවල හැර, MARA කාර්යාලයේ සමග ලියාපදිංචිවී නොමැතිනම්, ඕස්ට්‍රේලියාව තුල සංක්‍රමණ උපදෙස් ලබාදීම නීතිවිරෝධීවේ. සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුවේ ආකෘති අංක 956 මගින් බැහැර කරන ලද පුද්ගලයන්ගේ ලැයිස්තුවක් දක්වා ඇත.

සංක්‍රමණ නියෝජිතයෙකු උපයෝගී කර ගැනීමේදී දැනගත යුතු කරුණු

ඔබගේ නියෝජිතයා පහත කරුණු කළ යුතුවේ:

- ඔවුන් විසින් ඔබ වෙනුවෙන් කටයුතු කිරීමට එකගවූ පසු සංක්‍රමණ උපදෙස් වෘත්තීය විධිමත් කිරීම සඳහාවූ තොරතුරු (Information on the Regulation of the Migration Advice Profession) ඇතුලත් විස්තර පත්‍රිකාවේ පිටපතක් ඔබ වෙත ලබාදිය යුතුය. MARA කාර්යාලයේ වෙබ් අඩවිය වෙත යාම මගින්ද මෙහි පිටපතක් ලබාගත හැකිවේ.
- ඔබ විසින් ගෙවීම කිරීමට පෙර ඔවුන් විසින් අයකරනු ලබන සේවා සම්බන්ධ ලැයිස්තුවක් (Statement of Services) ඔබ වෙත ලබා දිය යුතුය.
- ඔබ විසින් ඉල්ලා සිටීමෙන් දින 7ක් ඇතුලත ඔබට අයත් ලියකියවිලි ඔබ වෙත ලබාදිය යුතුවේ.
- ඔබගේ අයදුම්පත්‍රයට අදාලව ඔබ සහ සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව සමග කරන සියළු සන්නිවේදනවල වාර්තා තබාගත යුතුවේ.

ඔබ විසින් පහත දේ කල යුතුය:

- ඔබගේ ගමන් බලපත්‍රය සහ උප්පැන්න සහතිකය වැනි ලියකියවිලිවල මුල් පිටපත් ඔබ ළග තබා ගත යුතුය. සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව මගින් ඉල්ලා සිටින බොහෝ ලියකියවිලි සහතික කරන ලද පිටපත් වශයෙන් ලබාදිය හැකිය.
- ඔබගේ නියෝජිත සමග කරන සියළු සාකච්ඡා සහ ලබාදෙන උපදෙස් ලිඛිතව තබා ගන්න. වෙන අයෙකු විසින් අයදුම්පත්‍රය සම්පූර්ණ කලද, සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන තොරතුරු සම්බන්ධයෙන් ඔබ වගකිව යුතුය.
- නියෝජිතගේ ගාස්තුවලට කුමන සේවා ඇතුලත්ද යන්න සම්බන්ධයෙන් අවබෝධයෙන් සිටින්න. MARA කාර්යාලයේ වෙබ් අඩවියේ නියෝජිතයන් විසින් අය කරන සාමාන්‍ය ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් ඇත. **පහත වෙබ් අඩවිය වෙත යන්න:** https://www.mara.gov.au/Consumer-Information/What-does-it-cost-to-use-an-Agent-/default.aspx

ඔබගේ සංක්‍රමණ නියෝජිත සම්බන්ධයෙන් ඇති ගැටළු

- ඔබට උපදෙස් අවශ්‍ය නම්, MARA කාර්යාල හා සම්බන්ධ වන්න.
- ***MARA කාර්යාලය හෝ සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් කිරීම මගින් ඔබගේ වීසා බලපත්‍ර අයදුම්පත්‍රයේ අවසාන ප්‍රතිඵලය සම්බන්ධයෙන් වෙනසක් සිදු වන්නේ නැත.***
- ඕස්ට්‍රේලියාව තුල ලියාපදිංචි නොමැති අය විසින් සංක්‍රමණ උපදෙස් ලබාදීම , දුරකථන අංක 1800 009 623 ඔස්සේ සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව වෙත දැනුම්දිය යුතුය.
- ඔබ හට තවදුරටත් ඔබගේ සංක්‍රමණ නියෝජිත උපයෝගී කර ගැනීමට අවශ්‍ය නොමැතිනම්, ආකෘති පත්‍ර අංක 956 හි B හා C කොටස් සම්පූර්ණ කිරීම මගින් ඒ බව, සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව වෙත දැනුම් දෙන්න.

වැඩිදුර විස්තර

Office of the MARA
www.mara.gov.au හෝ 1300 226 272.
යම් පුද්ගලයෙකු ලියාපදිංචිවී ඇතිද යන්න සොයා ගැනීමට www.mara.gov.au වෙත යොස්:

FIND AN AGENT

Department of Immigration and Citizenship
www.immi.gov.au හෝ 131 881.
ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් විස්තර දැනගැනීම සඳහා, දුරකථන අංක 131 450 ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව (Translation and Interpreting Service) අමතන්න.

Ethical profession | Empowered consumers | Engaged stakeholders